## <u>මාධ්‍ය නිවේදනය</u>

24-05-2023

### <u>ක්‍රිකට් පුහුණුකාරිණියක් වෙන්න කාන්තාවන්ට අවස්ථාවක්</u>

ඉතා සීඝ්‍රයෙන් ජනප්‍රියත්වයට පත්ව තිබෙන කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ අස්සක් මුල්ලක් නැරම ප්‍රචලිත කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සෑම අංශයක් කෙරෙහිම අවධානය යොමු කර තිබේ. එහි මූලිකම පියවර ලෙසින් කාන්තාවන්ට ක්‍රිකට් පුහුණු කිරීමේ ක්‍රමවේදය පිළිබඳව මූලික දැනුමක් ලබා දීම සඳහා පුහුණු පාඨමාලාවක් පැවැත්වීමට ශ්‍රී ලංකා ක්‍රිකට් විධිවිධාන යොදා තිබේ.

මූලික අදියර හෙවත් Level 0 සිට පැවැත්වෙන මෙම පුහුණු පාඨමාලාවට සහභාගිවීමට කැමැති වයස අවුරුදු 18 ට වැඩි කාන්තාවන්ට මේ සඳහා අයැදුම් කළ හැක. මෙහිදී ක්‍රිකට් ක්‍රීඩාවේ නියැලුණු කාන්තාවන්ට අමතරව දිවයින පුරා පාසල් වල සේවය කරන ශාරීරික පුහුණු උපදේශිකාවන්ට (PTI) සහ කාන්තා ක්‍රීඩා පුහුණුකාරිණියන්ට ද මෙම පුහුණු පාඨමාලාව හැදෑරීමේ අවස්ථාව උදාවනු ඇත.

ශ්‍රී ලංකාවේ පළාත් 4 ක් කේන්ද්‍ර කර ගනිමින් මෙම පුහුණු පාඨමාලාව ක්‍රියාත්මක වේ. එහිදී මධ්‍යම සහ නැගෙනහිර පළාත් ඒකාබද්ධව එක් කේන්ද්‍රස්ථානයකදීද වයඹ, උතුරු මැද සහ උතුරු යන පළාත ඒකාබද්ධව එක් කේන්ද්‍රස්ථානයකදීද, දකුණ සහ ඌව පළාත් එක් කේන්ද්‍රස්ථානයකදීද සහ බස්නාහිර පළාතේද මෙම පුහුණු පාඨමාලාවන් ක්‍රියාත්මක වනු ඇත.

මෙහි ඇති විශේෂත්වය වන්නේ ක්‍රිකට් ක්‍රීඩාව හඳුන්වාදීමේ පටන් ක්‍රියාත්මක අදියර 0 සිටම පාඨමාලාව ක්‍රියාත්මක වීමය. මේ සඳහා උනන්දුවන කාන්තාවන්ට මෙම අදියර නිමාවීමෙන් පසු ඉදිරියේදී පුහුණු අදියර i, ii, සහ iii යන (Level i,  Level ii, Level iii) පාඨමාලාවන් හැදෑරීමෙන් පසු ජාත්‍යන්තරය දක්වා යෑමේ අවස්ථාව උදාකරදීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඒකායන අභිප්‍රාය වී තිබේ.

ඒ ඒ පළාත් වෙනුවෙන් පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු උපදේශකයින් පත් කර තිබෙන අතර ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ඔවුන් ඇමැතීමෙන් ලබාගත හැක. මධ්‍යම සහ නැගෙනනහිර පළාත වෙනුවෙන් 0743442505 යන අංකයටද, වයඹ, උතුරු මැද සහ උතුරු පළාත වෙනුවෙන් 0777718303 යන අංකයටද, දකුණ සහ ඌව පළාත වෙනුවෙන් 0743449388 යන අංකයටද, සහ බස්නාහිර පළාත වෙනුවෙන් 0743451550 යන දුරකථන අංකයටද අමතා වැඩිදුර තොරතුරු දැනගත හැක.

**මාධ්‍ය අංශය**

**ශ්‍රී ලංකා ක්‍රිකට්**